# දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය

# රුහුණ විශ්වවිද්‍යාලය

# ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව

**රුහුණ විශ්වවිද්‍යාලයීය ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය මගින් පවත්වනු ලබන ඉහත පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමට සුදුසුකම් සපුරන අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.**

ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පාඨමාලාව සඳහා තෝරාගනු ලබන අතර පාඨමාලාව සති අන්ත දිනවල දී මාගාල්ලේ පිහිටුවා ඇති දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී (Outreach Centre) පැවැත්වේ.

**පාඨමාලාව සඳහා අයදුම් කිරීමේ සුදුසුකම්.**

- අ. පො. ස. (උ.පෙළ) විෂයන් තුනක් සමත් වීම හෝ වෙනත් ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලබා තිබීම.
- අ. පො. ස. (සා.පෙළ) විෂයන් හයක් සමත් වීම හා රැකියාවක නියුක්තව සිටීම.

(දැනට විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් ලියාපදිංචි වී ඇති හෝ විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමට පොරොත්තුව සිටින අයදුම්කරුවකු වෙතින් ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.)

**අයදුම්පත් නිකුත් කිරීම**

2017 ඔක්තෝබර් 01 දින සිට 2017 ඔක්තෝබර් 16 දින තෙක් සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා වේලාව තුළ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයට පැමිණ අයදුම්පත් හා අදාළ ලියකියවිලි ලබාගත හැක. අයදුම්පත් තැපැල් මගින් ගෙන්වා ගැනීමේදී මුද්දර අලවන ලද ඔබගේ ලිපිනය ලියූ 9"x4" ලියුම් කවරයක් පහත ලිපිනයට එවීමෙන් ලබා ගත හැක. තවද දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ www.dceu.ruh.ac.lk වෙබ් අඩවිය මගින් ද අයදුම් පත්‍රය හා අදාල ලියකියවිලි බාගත (Download) කර ගැනීමට හැක.

**අයදුම්පත් භාර ගැනීම**

ලංකා බැංකුවේ අංක 3695841 දරන රුහුණ විශ්වවිද්‍යාලයීය ගිණුමට රු.500/= ක මුදලක් අයදුම්පත්‍ර ගාස්තුව ලෙස ගෙවා ලබාගත් ලදුපත සමඟ සම්පූර්ණ කරන ලද අයදුම්පත 2017 ඔක්තෝබර් 17 දිනට පෙර පැමිණ හෝ තැපැල් මගින් **සහකාර ලේඛකාධිකාරී, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර** ලිපිනයට එවිය යුතු අතර අයදුම්පත්‍රය එවනු ලබන ලිපි කවරයේ වම් ඉහළ කෙලවරේ 'ඉංග්‍රීසි පාඨමාලාව සඳහා අයදුම් කිරීම' යනුවෙන් සඳහන් කළ යුතු වේ.

අසම්පූර්ණ හෝ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

විමසීම් : 041- 22 31 385 /041-2223133

**ලේඛකාධිකාරී,**
**රුහුණ විශ්වවිද්‍යාලය,**
**මාතර.**
2017.09.27